# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,393 - 2024 ජූලි මස 12 වැනි සිකුරාදා - 2024.07.12**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 210 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2024 අගෝස්තු මස 02 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2024 ජූලි මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2024 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කොළඹ දිසා අධිකරණයේ දී ය

## පිස්කල් මගින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

නඩු අංකය : DMB/115/2023
ඇස්කීසි අංකය :
ස්වභාවය : උකස් බැඳුම්කර
කාර්ය පටිපාටිය : සාමාන්‍ය
වටිනාකම : රු. 5,081,142.80

එස්. එම්. බී. ෆිනෑන්ස් පී. එල්. සී. (පෙර එස්. එම්. බී. ලීසිං පී. එල්. සී. යනුවෙන් හඳුන්වන ලද)
අංක 282/1, සී. බී. එස්. ගොඩනැගිල්ල,
ගාලු පාර, කොළඹ 03.

.................*පැමිණිලිකරු.*

*එදිරිව*

දොන් කසුන් නාගහවත්ත,
අංක 19, 1/1, යුනියන් පෙදෙස,
හිල් වීදිය, දෙහිවල.

*සහ*

අංක 99/10/02, දොඹගහලන්ද වත්ත,
පොල්හේන පාර, නිට්ටඹුව.

*සහ*

අංක 99//10/02, පොල්හේන පාර, නිට්ටඹුව.

*සහ*

අංක 37/1, වටරප්පල පාර, ගල්කිස්ස.

..................*විත්තිකරු.*

වර්ෂ 2023ක් වූ ජූලි මස 19 වැනි දින මෙම නඩුවෙ හි ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව විත්තිකරු විසින් පැමිණිලිකරුට,

*(අ)* රුපියල් 5,081,142.80 ක මුදලක් සහ වර්ෂ 2023.02.11 වැනි දින සිට එකී මුදල සම්පූර්ණයෙන් ගෙවා නිමවන තුරු රුපියල් 5,015,569.80ක මුදලක් මත වාර්ෂිකව 23%ක පොළිය සහ ඉන් අනතුරුව තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් නඩු ගාස්තු අයකර ගැනීම සඳහා එකී විත්තිකරුගේ ගෙවල්, ඉඩම්, බඩුමුට්ටු, අයවිය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් සහ අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතු බවටත්,

*(ආ)* මෙහි පහත උපලේඛනයෙ හි විස්තර කර ඇති ඉඩම සහ ඒ පරිශ්‍රය ද එකී ඉඩම සහ පරිශ්‍රය මත පිහිටි සියලු දේද එකී ඉඩම සහ පරිශ්‍රය සම්බන්ධයෙන් හෝ ඒ මත වූ විත්තිකරුගේ සියලු අයිතිවාසිකම් සහ හිමිකම් ද මේ නඩුවේ ලා ඇතුලත් කරනු ලබන තීන්දු ප්‍රකාශයක් ඉටු කිරීම පිණිස පැමිණිලිකරු විසින් නීත්‍යානුකූලව තහනමට ගෙන විකිණිය හැකි XII වශයෙන් ලකුණු කර මෙම පැමිණිල්ලට අමුණා ඇති ප්‍රසිද්ධ නොතාරිස් අයේෂා වීරකොන්ඩාරච්චි විසින් ලියා සහතික කරන ලද 2021.03.15 දිනැති අංක IDB/2021/07/477 දරන උකස් බැඳුම්කරය යටතේ සහ ඒ ප්‍රකාරව සහ එය ක්‍රියාත්මක වීමෙන් ඉහත සඳහන් මුදල් අයකර ගැනීම සඳහා බැඳී පවතින බවට සහ ක්‍රියාවේ යෙදවිය හැකි බවට ප්‍රකාශ කරන නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඇ)* ඉහත සඳහන් ප්‍රසිද්ධ නොතාරිස් අයේෂා වීරකොන්ඩාරච්චි විසින් ලියා සහතික කරන ලද 2021.03.15 දිනැති අංක IDB/2021/07/477 දරන උකස් බැඳුම්කරය ක්‍රියාවේ යෙදවීමේ ලා මෙහි පහත උපලේඛනයෙ හි විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය විකිණීමෙන් ලැබෙන මුදල් ප්‍රමාණවත් නොවුනහොත් මෙම නඩුවේ ලා ඇතුලත් කරන ලද තීන්දු ප්‍රකාශය යටතේ අයවීමට තිබෙන මුදල අයකර ගැනීම අරබයා පැමිණිලිකරු විසින් නීත්‍යානුකූලව තහනමට ගෙන විකිණිය හැකි විත්තිකරු සතු වෙනත් දේපළ තහනමට ගෙන විකිණීමට පැමිණිලිකරු හිමිකම් ලබන බවට ආඥා කරන නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඈ)* ඉහත සඳහන් මුදල් ගෙවීම/අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයෙ හි විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය බැඳී පවතින බවට සහ ක්‍රියාවේ යෙදවිය හැකි බවට ප්‍රකාශනාත්මක නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඉ)* තීන්දු ප්‍රකාශයේ දිනයේ සිට මාස 2ක් ඇතුලත ඉහත සඳහන් පරිදි පොළිය අය කිරීම්, වියදම් සහ නඩු ගාස්තු ද සමග ඉහත (අ) ඡේදයේ අයැද ඇති එකී මුදල් ප්‍රමාණයක් හෝ ඉන් යම් කොටසක් හෝ ගෙවීම පැහැර හරිනු ලැබීමේ දී මෙහි පහත උපලේඛනයෙහි විස්තර කර ඇති ඉඩම සහ පරිශ්‍රය අධිකරණය විසින් පත් කරන ලද වෙන්දේසිකරුවෙකු මගින් ආණ්ඩුවේ *ගැසට් පත්‍රයේ* සහ ප්‍රමාණවත් යැයි එකී වෙන්දේසිකරු සලකන යටත් පිරිසෙයින් එක් දේශීය ප්‍රවෘත්ති පත්‍රයක යථා පරිදි දැන්වීම් පළ කිරීමෙන් පසුව අධිකරණය විසින් අනුමත කරන ලද විකිණීමේ කොන්දේසි මත ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම සඳහා නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඊ)* එකී වෙන්දේසිකරු,

(i) එකී ඉඩම සහ පරිශ්‍රය එහි තක්සේරු කරන ලද වටිනාකමේ මුදලට විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසට සහ ඒ වටිනාකමේ මුදලට ලංසු තබන්නන් කිසිවෙකු නොවුවහොත් එවිට වෙන්දේසිකරු හට හෝ අධිකරණය විසින් පත් කරන වෙනත් නිලධාරියා හට නියෝගයක් නිකුත් කරන ලද අවස්ථාවේ දී තීන්දු ප්‍රකාශය යටතේ අයවීමට තිබුණු මුදලට ඒ විකිණීමේ දී ද ලංසු තබන්නන් කිසිවෙකු නොවන්නේ නම් එවිට ඉනික්බිතිව සිටින ඉහලම ලංසු තබන්නා වෙත විකිණීම සඳහා ඉදිරිපත් කරන ලෙසටත්,

(ii) පැමිණිලිකරු හෝ පැමිණිලිකරු වෙනුවෙන් වෙනත් තැනැත්තෙකුට ඒ විකිණීමේ දී උකස් කරන ලද ඉඩම සහ පරිශ්‍රය සඳහා ලංසු තබා මිලදී ගැනීමට ඉඩදෙන ලෙසට සහ පැමිණිලිකරු එහි ගැණුම්කරු වී නම් පැමිණිලිකරුගේ හිමිකම්පෑමේ සහ නඩු ගාස්තුවල ප්‍රමාණය හිලව් කර ගැනීමට පැමිණිලිකරුට ඉඩදෙන ලෙසටත්, විධාන කරන නියෝගයක් නිකුත් කරන නියෝගයක් නිකුත් කරන ලෙසටත්,

*(උ)* එකී වෙන්දේසිකරුට හෝ අධිකරණය විසින් පත් කරන වෙනත් නිලධාරියාට ඒ විකිණීමේ ගැණුම්කරු හෝ ගැණුම්කරුවන් විසින් විකිණීමේ කොන්දේසි අනුව ක්‍රියා කිරීමේ දී සහ,

(i) පැමිණිලිකරු ගැණුම්කරු වී නම් හිලව් කිරීමට ඉඩදෙන ලද මුදල අනුමත කරන ආඥාවක් සහ ගැණුම්කරුවන් තුන්වන පාර්ශ්වකරුවකු වුවහොත් ගැණුම් මුදල අධිකරණයේ යථා පරිදි තැන්පත් කර ඇතැයි ප්‍රකාශ කරන මේ අධිකරණයේ ආඥාවක්,

(ii) එකී විකිණීම ස්ථිර කරන ආඥාවක් ඉදිරිපත් කරනු ලැබීමේ දී ඒ විකිණීමේ ගැණුම්කරුගේ නමින් හෝ ගැණුම්කරුවන්ගේ නම්වලින් නීතිය අනුව පැවරුම් ඔප්පුවක් හෝ ඔප්පු ලියා සහතික කිරීමට අධිකරණය විසින් බලය දී විධාන කරන නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඌ)* ඉහත සඳහන් පරිදි විකුණන ලද එකී ඉඩමේ සහ පරිශ්‍රයේ හිස් සාමකාමී සන්තකය එහි ගැණුම්කරුට හෝ ගැණුම්කරුවන්ට භාරදෙන ලෙසට රෙජිස්ට්‍රාර්වරයාට/පිස්කල්වරයාට විධාන කරන නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(එ)* විකිණීමෙන් ලැබෙන මුදල් (*නැතහොත්* පැමිණිලිකරු ගැණුම්කරු වී නම් හිලව් කිරීමට පැමිණිලිකරුට ඉඩදෙන ලද මුදල) පැමිණිලිකරුගේ හිමිකම්පෑම පොළිය සහ ඉහත සඳහන් නඩු ගාස්තු ගෙවීම සඳහා සහ ඒ අරබයා යොදවන නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඒ)* මේ නඩුවේ ලා ඇතුලත් කරනු ලබන තීන්දු ප්‍රකාශයේ ඒ සියලු ගිණුම් ලබා ගැනීමේ විකිණීම පවත්වනු ලබන තැනැත්තා විකිණීම පවත්වනු ලබන ස්ථානය ගැණුම්කරුගේ නමින් හෝ ගැණුම්කරුවන්ගේ නම්වලින් කරනු ලබන පැවරීමේ ආකෘතිය සහ වෙනත් කවර හෝ කාරණයක් හෝ කාරණා සම්බන්ධයෙන් අවශ්‍ය සහ සුදුසු වෙනත් යම් සහ වැඩිදුර විධානය කිරීමේ බලය අධිකරණය විසින් අධිකරණය වෙත රඳවා තබා ගන්නා නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඔ)* ඉහත සඳහන් විකිණීමෙන් ලැබෙන මුදල් ඉහත සඳහන් (අ) ඡේදයේ අයැද ඇති මුදල් ප්‍රමාණයන් අය කර ගැනීම සඳහා ප්‍රමාණවත් නොවුවහොත් අයවීමට තිබෙන ඉතුරු මුදල අයකර ගැනීම පිණිස විත්තිකරුට අයත් වෙනත් දේපළ තහනමට ගෙන විකුණන නියෝගයක් නිකුත් කරන ලෙසත්,

*(ඕ)* නඩු ගාස්තු ලබා දෙන ලෙසත් දන්වා තීන්දු ප්‍රකාශ කොට ඇත.

එකී තීන්දු ප්‍රකාශය අනුව ගෙවීම් කිරීමට විත්තිකරු අපොහොසත් වී පැහැර හැර ඇති බැවින් එකී අධිකරණයෙන් මා වෙත ලැබී ඇති ඇස්කීසි බලපත්‍රයේ බලය පිට මා විසින් තහනමට ගෙන ඇති ඉහත නම් සඳහන් විත්තිකරුට අයත් පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති නිශ්චල දේපළ,

**වර්ෂ 2024ක් වූ අගෝස්තු මස 01 වැනි දින ප. ව. 2.00 ට,**

ඉහත නම් සඳහන් විත්තිකරුගේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, අත්තනගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 348ඒ, නිට්ටඹුව දකුණ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, නිට්ටඹුව, පොල්හේන පාර, වරිපනම් අංක 99/10/2 දරන, අංක 510607 දරන කැඩැස්තර සිතියමේ කැබලි අංක 0158 දරන සහ කලාප අංක 03 දරන හෙක්ටයාර් 0.0709 විශාල ඉඩම වේ. (අත්තනගල්ල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කර ඇත.) (හිමිකම් සහතික අංක 00070007283 යටතේ දැක්වෙන සම්පූර්ණ ඉඩම).

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

01. වෙන්දේසිය අවසන් කළ වහාම ගැණුම්කරු විසින් විකුණුම් මිලෙන් 25% මුදලින් ගෙවිය යුතු ය.
02. ඉතිරි 75% මුදල ලිත් මසක් ඇතුලත ඉහත අංක දරන නඩුවට අදාළ කොළඹ දිසා අධිකරණයේ තැන්පත් කළ යුතු ය.
03. රජයේ හා වෙනත් ගාස්තු ගෙවිය යුතුය.

රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
අත්තනගල්ල.

වර්ෂ 2024ක් වූ ජූනි මස 18 වැනි දින දී ය.

07-383

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.